# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2340/45 - 2023 ජූලි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2023.07.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වන වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ 2023 මැයි 17 දිනැති අංක 2332/14 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ සඳහන් අනෙකුත් භාණ්ඩ සම්බන්ධයෙන් කිසිදු වෙනසක් නොමැතිව, 2 වන වගන්තිය යටතේ බඩඉරිඟු (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1005.90.00) ආනයනයේ දී පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සහ සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා බඩඉරිඟු (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1005.90.00) ආනයනයේ දී ලබා දී ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බදු සහනයේ වලංගු කාලය පමණක් 2023 ජූලි මස 14 වන දින සිට මෙම නියමය මගින් අවලංගු කරමි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 ජූලි මස 13 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG - 07-0127


1A - PG 6388 — 431 (2023/07)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*